44

# සබරගමු නර්තන සම්ප්‍රදායට අයත් මල් බලි ශාන්ති කර්මය

*වී. පී. ජයකොඩි* [1]
HU/2012/0857

දේශිය නර්තන සම්ප්‍රදායන් ලෙස සැලකෙන උඩරට, පහතරට හා සබරගමු නර්තන සම්ප්‍රදායන් හි පැවති නමුත් වර්තමානය වන විට අභාවිත වන සබරගමු සම්ප්‍රදායට අයත් ශාන්ති කර්මයක් ලෙස සැලකෙන ''මල් බලි ශාන්ති කර්මය'' පිළිබඳ අවධානය යොමු කරමින් එහි අන්තර්ගතය සොයා බැලීම මෙම පර්යේෂණ පත්‍රිකාවෙහි මූලික අරමුණ වේ. සබරගමු කිරි මඩුව ශාන්ති කර්මය ආශ්‍රිත ව ඌවට සංක්‍රමණය වූ මල් බලි ශාන්ති කර්මය ඌව පළාතේ ගම් දනවු කිහිපයකට සීමා වුවකි. සශ්‍රිකත්වය මූලික අරමුණ කර ගත් මෙහි අස්වනුවලට සිදු වන හානි වළක්වා ගැනීම, ගව මහිෂාදීන් ට වැළදෙන වදුරු වසංගතවලින් මිදීම, දෙවියන්ගෙන් වැදී පැමිණෙන රෝගවලින් දරුවන් ආරක්ෂා කර ගැනීම මෙමගින් අපේක්ෂා කෙරේ. මෙම පර්යේෂණයට අදාළ දත්ත ගවේෂණයේදී දනට රචනා කොට ඇති ග්‍රන්ථ, ලිපි හා සඟරා වැනි ලිඛිත මූලාශ්‍ර ප්‍රධාන කොට ගත් අතර මෙකී මල් බලි ශාන්ති කර්මය සිදු කරනු ලබන ප්‍රවීන ඇදුරන් හා නර්තන ශිල්පීන් මෙන්ම එම ශාන්ති කර්මය පවත්වනු ලබන ප්‍රදේශයේ වැඩිහිටි ප්‍රදේශවාසීන් සමඟ පවත්වන ලද සම්මුඛ සාකච්ඡා උපයෝගී විය. එපමණක් නොව දත්ත ගවේෂණයේදී අද්‍යතනයේ පවත්නා නව තාක්ෂණය ද උපකාරි විය.

ප්‍රමුඛ පදඃ දේශිය නර්තන සම්ප්‍රදාය, සබරගමු නර්තන සම්ප්‍රදාය, මල් බලි ශාන්තිකර්මය,

*1 ප්‍රාසංගික කලා (විශේෂවේදී) දෙවන වසර*